# ආර්ථික විද්‍යාව

# Economics - MCQ

## වෙළඳපොළ අසමත්වීම

**පසුගිය වසර 06 ක බහුවරණ ප්‍රශ්න 2015 - 2022**

**කුෂාන්**
වීරහැන්නැදිගේ
Masters in Economics,
BA Economics (special),
Executive Diploma in Human Resource Management,
Executive Diploma in Strategic Business Management,
Diploma in Marketing Management,
Advance certificate training and Human Resource development.

**WhatsApp - 0768524299**

කුෂාන් වීරහැන්නැදිගේ

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

37. පහත සඳහන් දෑ අතුරෙන් වෙළෙඳපොළ අසමත් වීමක් ලෙස **නොසැලකෙනුයේ** කවරක් ද?
(1) ඒකාධිකාරී ව්‍යාපාරික ආයතන පැවතීම
(2) වායු හා ජල දූෂණය ඉතා ඉහළ මට්ටමක තිබීම
(3) ජාතික ආරක්ෂාව වැනි අත්‍යවශ්‍ය සේවා ප්‍රමාණවත්ව නොසැපයීම
(4) පොදු භාණ්ඩ ප්‍රමාණවත් ව සැපයීම
(5) අසමාන ආදායම් ව්‍යාප්තියක් පැවතීම (......)

38. නිෂ්පාදන ක්‍රියාවලිය නිසා හට ගන්නා බාහිර පිරිවැය, කිසියම් කර්මාන්තයක් විසින් නොසලකා හැරේ නම්, තරගකාරී වෙළෙඳපොළක සමතුලිත නිමැවුමට අදාළ නිවැරදි ප්‍රකාශය වනුයේ කවරක් ද?
(1) මිල, ආන්තික සමාජ පිරිවැයට වඩා වැඩි අගයක් ගනු ඇත.
(2) මිල, ආන්තික සමාජ පිරිවැයට වඩා අඩු අගයක් ගනු ඇත.
(3) මිල, ආන්තික සමාජ පිරිවැයට සමාන වනු ඇත.
(4) ආන්තික පෞද්ගලික පිරිවැය, ආන්තික සමාජ පිරිවැයට සමාන වනු ඇත.
(5) ආන්තික පෞද්ගලික පිරිවැය, ආන්තික සමාජ පිරිවැයට වඩා වැඩි අගයක් ගනු ඇත. (......)

39. ශුද්ධ පොදු භාණ්ඩයක් යනු,
(1) වෙළෙඳපොළ විසින් කාර්යක්ෂමව සපයනු ලබන භාණ්ඩයකි.
(2) පරිභෝජනයේ තරගකාරීත්වයක් පවතින සහ පරිභෝජනය වැළැක්විය හැකි භාණ්ඩයකි.
(3) පරිභෝජනයේ තරගකාරීත්වයක් නොමැති සහ පරිභෝජනය වැළැක්විය හැකි භාණ්ඩයකි.
(4) පරිභෝජනයේ තරගකාරීත්වයක් පවතින සහ පරිභෝජනය වැළැක්විය නොහැකි භාණ්ඩයකි.
(5) පරිභෝජනයේ තරගකාරීත්වයක් නොමැති සහ පරිභෝජනය වැළැක්විය නොහැකි භාණ්ඩයකි. (......)

කුෂාන් වීරහැන්නැදිගේ

**40.** රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ, රජය,

(1) වෙළෙඳපොළ පොලී අනුපාතික තීරණය කරයි.

(2) මුදල් සැපයුමේ වර්ධන අනුපාතිකය තීරණය කරයි.

(3) බදු අය කිරීම හා ආණ්ඩුවේ වියදම් මට්ටම් තීරණය කරයි.

(4) මුදල් සැපයුම තීරණය කරයි.

(5) උද්ධමන අනුපාතිකය තීරණය කරයි. (……)

**41.** වර්තමානයේ ශ්‍රී ලංකා රජයේ විශාලතම බදු අයහාර මූලාශ්‍රය වනුයේ,

(1) එකතු කළ අගය මත අයකරන බද්ද ය. (2) සමාගම් ආදායම් බද්ද ය. (3) නිෂ්පාදන බද්ද ය.

(4) ආනයන බද්ද ය. කුෂාන් වීරහැන්නැදිගේ (5) උපයන විට ගෙවීමේ බද්ද ය. (PAYE) (……)

කුෂාන් වීරහැන්නැදිගේ

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

කුෂාන් වීරහැන්නැදිගේ

33. පරිභෝජනයේ තරගකාරිත්වයක් නොමැති සහ පරිභෝජනයෙන් බැහැර කරලීමේ හැකියාවක් නොමැති භාණ්ඩයක්,
(1) ශුද්ධ පෞද්ගලික භාණ්ඩයක් විය නොහැකි ය.
(2) ශුද්ධ පොදු භාණ්ඩයක් විය නොහැකි ය.
(3) ඩාල භාණ්ඩයක් විය නොහැකි ය.
(4) අර්ධ පොදු භාණ්ඩයක් විය නොහැකි ය.
(5) ගෝලීය පොදු භාණ්ඩයක් විය නොහැකි ය. (……)

34. ප්‍රතික්‍රමික ආදායම් බද්දක් ක්‍රියාත්මක වන විට දී දිළින්දෝ,
(1) තම ආදායමින් ධනවත් අයට වඩා අඩු ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති.
(2) ධනවත් අයට වඩා වැඩි රුපියල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(3) තම ආදායම් මට්ටම සමග සමානුපාතික ව වෙනස් වන බද්දක් ගෙවති.
(4) ධනවත් අයට වඩා අඩු රුපියල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(5) තම ආදායමින් ධනවත් අයට වඩා වැඩි ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති. (……)

35. වැඩිපුර තවත් එක් පුද්ගලයකුට ශුද්ධ පොදු භාණ්ඩයක් භාවිත කිරීමට ඉඩ සලසා දීමේ ආන්තික සමාජ පිරිවැය,
(1) සෘණ වේ.
(2) ශූන්‍ය වේ.
(3) ධන වේ.
(4) අපරිමිත වේ.
(5) භාවිත කරන්නන් සංඛ්‍යාව වැඩි වෙත්ම ඉහළ යයි. (……)

කුෂාන් වීරහැන්නැදිගේ

**36.** නිදහස් වෙළෙඳපොළක් තුළ නිෂ්පාදනය කෙරෙන එක්තරා භාණ්ඩයක සමතුලිත නිමැවුම් මට්ටමේ දී එම භාණ්ඩයේ ආන්තික පෞද්ගලික හා බාහිර ප්‍රතිලාභත්, ආන්තික පෞද්ගලික හා බාහිර පිරිවැයත් වගුවෙහි දැක්වේ.

| අයිතමය | රුපි. මිලියන | අයිතමය | රුපි. මිලියන |
|---|---|---|---|
| ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ | 36 | ආන්තික පෞද්ගලික පිරිවැය | 24 |
| ආන්තික බාහිර ප්‍රතිලාභ | 18 | ආන්තික බාහිර පිරිවැය | 0 |

මෙම වෙළෙඳපොළට රජය මැදිහත් වීමෙන් සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ දැමිය හැකි ය. මක් නිසාද යත් එම භාණ්ඩය,

(1) පොදු භාණ්ඩයක් වන බැවිනි.
(2) ශුභ සාධන භාණ්ඩයක් වන බැවිනි.
(3) අවගුණ භාණ්ඩයක් වන බැවිනි.
(4) ගෝලීය පොදු භාණ්ඩයක් වන බැවිනි.
(5) බාල භාණ්ඩයක් වන බැවිනි. (......)

**37.** අයවැය හිඟය මූල්‍යනයට යොදා ගනු ලබන පහත සඳහන් ක්‍රම අතුරෙන්, සමාහාර ඉල්ලුම විශාලතම ප්‍රමාණයකින් වැඩි කළ හැක්කේ කවරක් මගින් ද?

(1) විදේශිකයන්ට පිළිණපත් අලෙවි කිරීම
(2) මහ බැංකුවට පිළිණපත් අලෙවි කිරීම
(3) වාණිජ බැංකුවලට පිළිණපත් අලෙවි කිරීම
(4) ජාතික ඉතිරි කිරීමේ බැංකුවට පිළිණපත් අලෙවි කිරීම
(5) සේවක අර්ථසාධක අරමුදලට පිළිණපත් අලෙවි කිරීම (......)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I


පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

කුෂාන් වීරහැන්නැදිගේ

36. ශුද්ධ පොදු භාණ්ඩයකට නිදසුනක් වනුයේ,

(1) සෞඛ්‍ය සේවාවයි.
(2) ජාතික කෞතුකාගාරයයි.
(3) ජාතික ආරක්ෂාවයි.
(4) දුම්රිය ප්‍රවාහන සේවයයි.
(5) අධ්‍යාපනයයි. (......)

**37.** කිසියම් විශේෂිත භාණ්ඩයක් සඳහා අදාළ ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ (MPB) සහ ආන්තික සමාජ ප්‍රතිලාභ (MSB) වක්‍රත්, වෙළෙඳපොළ සැපයුම් වක්‍රයත් (S) පහත රූපසටහනෙහි දැක්වේ.




මෙම වෙළෙඳපොළට ආණ්ඩුවේ මැදිහත්වීමක් නොතිබුණහොත්, සම්පත් බෙදා වෙන්කිරීමේ අකාර්යක්ෂමතාවක් හට ගැනීමට ඉඩ ඇත. මක් නිසාද යත්,

(1) නිදහස් වෙළෙඳපොළෙහි මිල ඉතා ඉහළ මට්ටමක තිබීම නිසා ය.
(2) H-J ප්‍රමාණයෙන් භාණ්ඩයේ අධි නිෂ්පාදනයක් හට ගැනීම නිසා ය.
(3) නිදහස් වෙළෙඳපොළෙහි නිමැවුම ඉතා ඉහළ මට්ටමක තිබීම නිසා ය.
(4) H-J ප්‍රමාණයෙන් එම භාණ්ඩයේ ඌන පරිභෝජනයක් හට ගැනීම නිසා ය.
(5) පරිභෝජනයේ සෘණ බාහිරතාවක් පැවතීම නිසා ය.

කුෂාන් වීරහැන්නැදිගේ

38. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයභාරය සහ දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතයත්, රාජ්‍ය වියදම සහ දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතයත් ආසන්න වශයෙන්

| | අයභාරය/දළ.දේ.නි. අනුපාතය (%) | වියදම/දළ.දේ.නි. අනුපාතය (%) |
|---|---|---|
| (1) | 15 - 16 කි. | 25 - 26 කි. |
| (2) | 12 - 13 කි. | 24 - 25 කි. |
| (3) | 13 - 14 කි. | 20 - 21 කි. |
| (4) | 10 - 11 කි. | 15 - 16 කි. |
| (5) | 15 - 16 කි. | 18 - 19 කි. |

(......)

39. ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමේ ප්‍රධාන සංරචක, මුළු වියදම තුළ ඒවා දරණ සාපේක්ෂ වැදගත්කම අනුව පෙළගස්වනු ලැබුවහොත් ඒවායේ අනුපිළිවෙළ වනුයේ

(1) කුටුම්බ සඳහා ලබා දුන් සංක්‍රාම, පොලී ගෙවීම්, වැටුප් හා වේතන වශයෙනි.
(2) වැටුප් හා වේතන, පොලී ගෙවීම්, කුටුම්බ සඳහා ලබා දුන් සංක්‍රාම වශයෙනි.
(3) රාජ්‍ය ආයතනවලට ලබා දුන් සංක්‍රාම, පොලී ගෙවීම්, වැටුප් හා වේතන වශයෙනි.
(4) කුටුම්බ සඳහා ලබා දුන් සංක්‍රාම, වැටුප් හා වේතන, පොලී ගෙවීම් වශයෙනි.
(5) පොලී ගෙවීම්, රාජ්‍ය ආයතනවලට ලබා දුන් සංක්‍රාම, කුටුම්බ සඳහා ලබා දුන් සංක්‍රාම වශයෙනි. (......)

**40.** මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය හිඟය දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යයනය කිරීමේ දී, පුළුල් වශයෙන් භාවිත කළ ණය උපකරණය වූයේ

(1) භාණ්ඩාගාර බිල්පත් ය.
(2) භාණ්ඩාගාර බැඳුම්කර ය.
(3) රුපියල් සුරැකුම්පත් ය. කුෂාන් වීරහැන්නැදිගේ
(4) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ය.
(5) මහ බැංකුවේ අත්තිකාරම් ය. (......)

කුෂාන් වීරහැන්නැදිගේ

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
# கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
# General Certificate of Education (Adv. Level) Examination, August 2018

**2018.08.06 / 1300 - 1500**

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

**21 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

කුෂාන් වීරහැන්නැදිගේ

**35.** කිසියම් භාණ්ඩයක් පරිභෝජනය කිරීමේදී ධන බාහිරතා ජනනය කෙරෙන විට, එබඳු භාණ්ඩයක වෙළෙඳපොළ සමතුලිතය පිළිබඳව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?

(1) ආන්තික සමාජ ප්‍රතිලාභය, ආන්තික පෞද්ගලික පිරිවැයට වඩා අඩු ය.
(2) ආන්තික සමාජ ප්‍රතිලාභය, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභයට වඩා විශාල ය.
(3) ආන්තික සමාජ පිරිවැය, ආන්තික සමාජ ප්‍රතිලාභයට වඩා වැඩි ය.
(4) ආන්තික සමාජ පිරිවැය, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභයට වඩා අඩු ය.
(5) ආන්තික සමාජ පිරිවැය, ආන්තික සමාජ ප්‍රතිලාභයට සමාන වේ. (......)

**36.** 'ආණ්ඩුව අසමත් වීම' නමින් ආර්ථික විද්‍යාඥයින් විසින් හඳුන්වනු ලබන සංසිද්ධියට වඩාත් ම බලපෑ හැකි හේතුව වන්නේ පහත සඳහන් දෑ අතුරෙන් කවරක් ද?

(1) ඇතැම් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේදී සෘණ බාහිරතා හටගැනීම
(2) අවගුණ භාණ්ඩ (demerit goods) අධි පරිභෝජනය
(3) ආදායම් හා ධන ව්‍යාප්තිය අසමාන වීම
(4) වෙළෙඳපොළවල අපූර්ණ තරගය පැවතීම
(5) දේශපාලනඥයින් ස්වාර්ථය උදෙසා යොමු වීම (......)

**37.** ශුද්ධ පොදු භාණ්ඩයක්, තවත් එක් අතිරේක පාරිභෝගිකයකු වෙත සැපයීමේ ආන්තික පිරිවැය පිළිබඳව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?

(1) ධන අගයක් ගනියි.
(2) ශූන්‍යයට සමාන ය.
(3) භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආරම්භක පිරිවැයට සමාන වේ.
(4) පාරිභෝගිකයන් සංඛ්‍යාව අඩුවෙත්ම අඩු වේ.
(5) පාරිභෝගිකයන් සංඛ්‍යාව අඩුවෙත්ම වැඩි වේ. (......)

තුෂාන් වීරහැන්නැදිගේ

**38.** ශ්‍රී ලංකාවේ බදු අයභාරයේ ප්‍රධාන මූලාශ්‍ර වනුයේ,
(1) ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද හා නිෂ්පාදන බදු වේ.
(2) එකතු කළ අගය මත බද්ද, පිරිවැටුම් බද්ද හා ආර්ථික සේවා ගාස්තු වේ.
(3) ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද හා මුද්දර බද්ද වේ.
(4) එකතු කළ අගය මත බද්ද, ආනයන බද්ද හා ජාතිය ගොඩගැනීමේ බද්ද වේ.
(5) එකතු කළ අගය මත බද්ද, වරාය හා ගුවන්තොටුපළ ගාස්තු හා ආර්ථික සේවා ගාස්තු වේ. (……)

**39.** ආර්ථික පසු බැසීමක් (ප්‍රතිගමනය) සමනය කිරීම සඳහා වඩාත් යෝග්‍ය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් වනුයේ පහත සඳහන් කවරක ඉහළ නැංවීමක් ද?
(1) පොලී අනුපාතික
(2) මුදල් සැපයුම
(3) බදු
(4) ආණ්ඩුවේ බැඳුම්කර අලෙවි කිරීම
(5) ආණ්ඩුවේ වියදම් (……)

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.05 / 1300 - 1500

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

31. කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ දී සෘණ බාහිරතාවක් පවතී නම්, සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම අත්කර ගත හැක්කේ

(1) නිදහස් වෙළෙඳපොළ සමතුලිතය මගිනි.
(2) නිමැවුම මත සහනාධාරයක් ලබා දීමෙනි.
(3) නිමැවුම් ප්‍රමාණය මත සීමාවක් පැනවීමෙනි.
(4) භාණ්ඩය රජය විසින් මිල දී ගැනීමෙනි.
(5) නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ ප්‍රමාණය පිළිබඳව අවමයක් නියම කිරීමෙනි.

32. ශුද්ධ පොදු භාණ්ඩයක් තවත් එක් අතිරේක පුද්ගලයෙකුට භාවිතයට ගැනීමට ඉඩ සලසාදීමේ ආන්තික පිරිවැය

(1) ධන අගයක් වේ.
(2) සෘණ අගයක් වේ.
(3) ශූන්‍ය අගයක් වේ.
(4) අපරිමිත අගයක් වේ.
(5) පරිභෝජනය වැඩිවෙත් ම වැඩි වේ.

33. සුභසාධන භාණ්ඩයක් යනු

(1) හිමිකරගන්නා පුද්ගලයාටත් සමාජයටත් යන දෙපිරිසටම ප්‍රතිලාභ ලබා දෙන භාණ්ඩයකි.
(2) නිෂ්පාදනය කිරීමේ දී සමාජ පිරිවැයක් නොමැති භාණ්ඩයකි.
(3) පරිභෝජනයේ දී පෞද්ගලික ප්‍රතිලාභ සමාජ ප්‍රතිලාභ ඉක්මවා යන භාණ්ඩයකි.
(4) වෙළෙඳපොළ බලවේග ඔස්සේ සැපයිය නොහැකි භාණ්ඩයකි.
(5) වෙළෙඳපොළ බලවේග ඔස්සේ කාර්යක්ෂමව සැපයිය හැකි භාණ්ඩයකි.

**34.** ආණ්ඩුවේ අයවැය ලේඛනයේ ප්‍රාථමික හිඟුමේ ශේෂය නිර්වචනය කෙරෙනුයේ

(1) බදු අයභාරය සහ ප්‍රාග්ධන වියදම් අතර වෙනස ලෙස ය.

(2) දීමනා ඇතුළත් මුළු අයභාරය සහ ණය සඳහා පොලී ගෙවීම් හැර මුළු වියදම් අතර වෙනස ලෙස ය.

(3) මුළු අයභාරය සහ ණය ආපසු ගෙවීම් ඇතුළත් මුළු වියදම අතර වෙනස ලෙස ය.

(4) බදු අයභාරය සහ පුනරාවර්තන වියදම අතර වෙනස ලෙස ය.

(5) මුළු අයභාරය සහ පුනරාවර්තන වියදම අතර වෙනස ලෙස ය.

**35.** වර්තමානයේ ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමෙහි විශාලතම සංරචකය වනුයේ

(1) පොලී ගෙවීම් ය. (2) වැටුප් සහ වේතන ය.

(3) විශ්‍රාම වැටුප් ගෙවීම් ය. (4) පොහොර සහනාධාරය ය.

(5) රාජ්‍ය සංස්ථා වෙත ලබා දෙන වර්තන පැවරුම් ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
# கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
# General Certificate of Education (Adv. Level) Examination, 2020

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**31.** නිදහස් වෙළෙඳපොළක් තුළ බාහිරතාවක් පවතින විට,

(1) සමතුලිත මිල කෘත්‍රිම වශයෙන් ඉහළ මට්ටමක තීරණය වේ.
(2) සමතුලිත මිල කෘත්‍රිම වශයෙන් පහළ මට්ටමක තීරණය වේ.
(3) වෙළෙඳපොළට සමතුලිතය කරා ළඟාවීමට නොහැකි වේ.
(4) වෙළෙඳපොළ සමතුලිතය සමාජයීය වශයෙන් ප්‍රශස්ත සම්පත් බෙදීයාමක් තහවුරු නොකරයි.
(5) එම භාණ්ඩය පරිභෝජනය කරන පාරිභෝගිකයෝ නඩත්තු සහ රක්ෂණ සඳහා අතිරේක පිරිවැයක් දරති.

**32.** පොදු භාණ්ඩ නිෂ්පාදනය කිරීමට වෙළෙඳපොළ අසමත් වන්නේ,

(1) එබඳු භාණ්ඩ සඳහා ඉල්ලුමක් නොමැති බැවිනි.
(2) එබඳු භාණ්ඩයක් පරිභෝජනය කරන පාරිභෝගිකයන්ගෙන් මිලක් අයකර ගැනීමට නිෂ්පාදකයාට නොහැකි වන බැවිනි.
(3) සාමාන්‍යයෙන් එබඳු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී විශාල බාහිර පිරිවැයක් හටගන්නා බැවින් සහ පාරිභෝජනයේ දී බාහිර ප්‍රතිලාභ ජනනය කරන බැවිනි.
(4) එබඳු භාණ්ඩ නිෂ්පාදනය ආදායම් අසමානතා වැඩිවීමට හේතුවන බැවිනි.
(5) සාමාන්‍යයෙන් රාජ්‍ය අංශයට වඩා පෞද්ගලික ආයතනවල නිෂ්පාදන පිරිවැය අධික බැවිනි.

33. ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමෙහි ප්‍රධාන සංරචක වනුයේ
(1) පොලී ගෙවීම්, මූර්ත වත්කම් අත්කර ගැනීම, වැටුප් හා වේතන සහ කුටුම්බ සඳහා පැවරුම් ය.
(2) පොලී ගෙවීම්, වැටුප් හා වේතන, රාජ්‍ය සංස්ථා සඳහා ප්‍රාග්ධන පැවරුම් සහ විශ්‍රාම වැටුප් ගෙවීම් ය.
(3) පොලී ගෙවීම්, වැටුප් හා වේතන, කුටුම්බ සඳහා වර්තන පැවරුම් සහ රාජ්‍ය සංස්ථා සඳහා වර්තන පැවරුම් ය.
(4) පොලී ගෙවීම්, වැටුප් හා වේතන, ණය ආපසු ගෙවීම් සහ කුටුම්බ සඳහා වර්තන පැවරුම් ය.
(5) පොලී ගෙවීම්, වැටුප් හා වේතන, මූල්‍ය වත්කම් අත්කර ගැනීම සහ පොහොර සහනාධාරය ය.

34. ප්‍රතික්‍රමික ආදායම් බද්දක් යටතේ දිළිඳු ජන කොටස්,
(1) ධනවත් අයට වඩා තම ආදායමෙන් අඩු ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති.
(2) ධනවත් අයට වඩා විශාල රුපියල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(3) තම ආදායමෙන් සමානුපාතිකව වෙනස්වන ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(4) ධනවත් අයට වඩා තම ආදායමෙන් ඉහළ ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති.
(5) බදු අයභාරය යොදා ගනිමින් අත්‍යවශ්‍ය භාණ්ඩ මිලයට ගැනීමට සමත්වෙති.

35. වර්තමානයේ ශ්‍රී ලංකා මධ්‍යම රජයේ ප්‍රධානතම අයභාර මූලාශ්‍රය වනුයේ
(1) ආදායම් බදු ය.
(2) නිෂ්පාදනය හා වියදම මත බදු ය.
(3) ලාභ, ලාභාංශ හා පොලී ආදායම් ය.
(4) වෙළෙඳ ව්‍යවසායන්ගේ දළ ඉපැයීම් ය.
(5) ලොතරැයි අයභාරයයි. කුෂාන් වීරහැන්නැදිගේ

කුෂාන් වීරහැන්නැදිගේ

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

**21 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**31.** පොදු සම්පත්වල ප්‍රධාන ලක්ෂණ වනුයේ,

(1) පරිභෝජනයේ තරගකාරීත්වය හා බැහැර කළ නොහැකි වීම ය.


(2) පරිභෝජනයේ තරගකාරීත්වයක් නොමැතිකම හා බැහැර කළ හැකි වීම ය.

(3) පරිභෝජනයේ තරගකාරීත්වයක් නොමැතිකම හා බැහැර කළ නොහැකි වීම ය.

(4) නියාමනය කළ හැකි වීම හා බැහැර කළ හැකි වීම ය.

(5) පරිභෝජනයේ තරගකාරීත්වය හා බැහැර කළ හැකි වීම ය.

**32.** පෞද්ගලික සහ සමාජ ආන්තික පිරිවැය වක්‍රත්, වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රයත් පහත රූපසටහනහි පෙන්නුම් කරයි.




මෙම වෙළෙඳපොළ නියාමනයකින් තොර නිදහස් වෙළෙඳපොළක් වේ නම්, එහි

(1) නිමැවුම් මට්ටම සමාජයීය වශයෙන් ප්‍රශස්ත වන නමුදු මිල ඉතා අඩු අගයක් ගනියි.

(2) නිමැවුම් මට්ටම සමාජයීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට වඩා අඩු නමුදු මිල ඉතා අඩු අගයක් ගනියි.

(3) සම්පත් බෙදා වෙන් කිරීම ඉතා කාර්යක්ෂම වනු ඇත.

(4) අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ඇත.

(5) අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ඇත.

**33.** අයවැය ලේඛනයේ ප්‍රාථමික ශේෂය යනු,

(1) ආණ්ඩුවේ මුළු වියදම සහ මුළු පුනරාවර්තන වියදම අතර වෙනස ය.

(2) ආණ්ඩුවේ අයවැය හිඟය සහ ණය සේවා ගෙවීම් අතර වෙනස ය.

(3) මුළු අයහාරය සහ ණය සඳහා පොලී ගෙවීම් ඇතුළත් මුළු වියදම අතර වෙනස ය. කුෂාන් වීරහැන්නැදිගේ

(4) දීමනා ඇතුළත් මුළු අයභාරය සහ ණය සඳහා පොලී ගෙවීම් ඇතුළත් මුළු ප්‍රාග්ධන වියදම අතර වෙනස ය.

(5) දීමනා අතුළත් මුළු අයභාරය සහ ණය සඳහා පොලී ගෙවීම් ඇතුළත් මුළු පුනරාවර්තන වියදම අතර වෙනස ය.

**34.** 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකා මධ්‍යම රජයේ නොපිය වූ මුළු දේශීය හා විදේශීය ණය ප්‍රමාණයන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් පිළිවෙළින්

(1) 44.1% ක් සහ 42.6% ක් විය.

(2) 48.2% ක් සහ 40.3% ක් විය.

(3) 35.4% ක් සහ 46.6% ක් විය.

(4) 42.7% ක් සහ 38.4% ක් විය.

(5) 42.2% ක් සහ 30.0% ක් විය.

**35.** පහත සඳහන් දෑ අතුරින් සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්තියක් ලෙස සැලකිය හැක්කේ කවරක් ද?

(1) ආණ්ඩුවේ අයවැය හිඟය අඩු කිරීම

(2) ආයෝජනය දිරිමත් කිරීමට ව්‍යාපාර සඳහා ආයෝජන බදු සහන ලබා දීම

(3) ආනයන භාණ්ඩ මත තීරු බදු පැනවීම

(4) පෞද්ගලික හිමිකම සහිත ව්‍යාපාර රාජ්‍ය අංශය වෙත පැවරීම

(5) සමාහාර වියදමේ ඉහළ යාමක් ඇතිවන අන්දමින් ආණ්ඩුවේ වියදම් ඉහළ නැංවීම

Activat
Go to Set

කුෂාන් වීරහැන්නැදිගේ

AL/2022(2023)/21/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

| | |
|---|---|
| **ආර්ථික විද්‍යාව** | **I** |
| பொருளியல் | **I** |
| Economics | **I** |

**21 S I**

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

කුෂාන් වීරහැන්නැදිගේ

**32.** පොදු භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් සත්‍ය වේ ද?

(1) එක් පුද්ගලයෙකුගේ පරිභෝජනය නිසා සෙසු අයට ලැබෙන ප්‍රමාණය අඩු වේ.

(2) ඒ සඳහා ගෙවීමක් නොකරන පාරිභෝගිකයන් ඉන් ප්‍රතිලාභ ලබාගැනීමෙන් බැහැර කළ හැකි වේ.

(3) පොදු භාණ්ඩයක වැඩිපුර ඒකකයක් ඇතැම් පාරිභෝගිකයන්ට ලැබෙන විට සෙසු පාරිභෝගිකයන්ට ලැබෙන ප්‍රමාණය එම ප්‍රමාණයෙන් ම අඩු වේ.

(4) එක් පුද්ගලයෙකුගේ පරිභෝජනය සෙසු අය එම භාණ්ඩය පරිභෝජනය කිරීමෙන් බැහැර නොකරයි.

(5) සැම දෙනාම භාණ්ඩය සඳහා සමාන මිලක් ගෙවති.

කුෂාන් වීරහැන්නැදිගේ

**33.** කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කරන විට ධන බාහිරතා හටගනී නම්, පහත සඳහන් කවරක් සත්‍ය වේ ද?

(1) රජය විසින් එම භාණ්ඩය නිෂ්පාදනය නොකළ යුතු ය.

(2) පෞද්ගලික අංශයේ නිෂ්පාදනය සමාජයීය වශයෙන් හිතකර මට්ටමට වඩා පහළින් පවතී.

(3) එම භාණ්ඩයේ වෙළෙඳපොළ මිල ඉතා ඉහළ අගයක් ගනු ඇත.

(4) එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම රජය විසින් අධෛර්යමත් කළ යුතු ය.

(5) එම භාණ්ඩය නිෂ්පාදනය කිරීමෙන් පෞද්ගලික ආයතනවලට ලාභ උපරිම කිරීමට නොහැකි වනු ඇත.

**34.** තෙරපුම් ප්‍රතිවිපාකයෙන් විස්තර කෙරෙනුයේ පහත සඳහන් කවරක් ද?

(1) අයවැය හිඟය මූල්‍යනය සඳහා ණය ලබාගන්නා විට රජය පෞද්ගලික ණය ගනුවන් සමග තරග කිරීමේ දී පොලී අනුපාතික ඉහළ යාම හේතුවෙන් පෞද්ගලික ආයෝජනය පහළ වැටේ.

(2) රජය පොලී අනුපාතික ඉහළ නොදමා මුදල් සැපයුම වැඩි කරන විට උද්ධමන අනුපාතිකය සහ පෞද්ගලික ආයෝජන වැඩි වේ.

(3) ව්‍යාපාරික ආයතන ආයෝජන ව්‍යාපෘති සඳහා තරග කරන විට ඉතා දුබල සමාගම් තරගයේ තෙරපුමට ලක්වීමෙන් ව්‍යාපාරික බිඳ වැටීම හටගනී.

(4) රජය මුදල් වෙළෙඳපොළෙන් බැඳුම්කර නැවත මිලට ගන්නා විට මුදල් සැපයුම අඩුවන අතර පෞද්ගලික ආයෝජකයන්ට ණය ලබා ගැනීම සඳහා තරග කිරීමට සිදු වේ.

(5) ව්‍යාපාරික අංශය මුදල් ණයට ගන්නා විට රජය සමග තරග කරන අතර එහි දී පොලී අනුපාතික පහළ වැටීම නිසා පෞද්ගලික ආයෝජනය ඉහළ නගී.

35. වෙළෙඳපොළ අසමත්වීම් හටගනුයේ

(1) නිෂ්පාදන ආයතනවලට අඛණ්ඩව විශාල අලාභ ඇරීමට සිදුවන විට දී ය.

(2) නිෂ්පාදන ආයතනවලට තම නිෂ්පාදිත සඳහා වෙළෙඳපොළ සොයා ගැනීමට නොහැකිවන විට දී ය.

(3) ඉල්ලුම පහළ වැටීම නිසා ඔවුන්ගේ නිෂ්පාදනය කපා හැරීමට නිෂ්පාදන ආයතනවලට සිදුවන විට දී ය.

(4) මිල ඉහළ යාම නිසා තම අවශ්‍යතා සපුරාගැනීමට පාරිභෝගිකයන්ට දුෂ්කරවන විට දී ය.

(5) මිල යන්ත්‍රණය විසින් සම්පත් කාර්යක්ෂමව බෙදා වෙන් නොකරන විට දී ය.

36. 2020 වර්ෂයේ දී ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමේ විශාලතම අයිතමය වූයේ

(1) වැටුප් සහ වේතනයි. කුෂාන් වීරහැන්නැදිගේ

(2) රජයේ වර්තන පැවරුම් සහ සහනාධාරයි.

(3) විශ්‍රාම වැටුප් ය.

(4) පොලී ගෙවීම් ය.

(5) පොහොර සහනාධාරයි.

කුෂාන් වීරහැන්නැදිගේ

**ඉදිරි VIDEO බැලීම සඳහා SUBSCRIBE කරන්න**